**පස්ගොඩ ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ගිවිසුම්ගත වී වැඩ ආරම්භ කර නොතිබූ ඌරුබොක්ක බස් නැවතුම්පොළෙහි ජල ටැංකිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.2,859,239 ක කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | 2022 දෙසැම්බර් 30 දින ගිවිසුම්ගතවී එදින වැඩ ආරම්භ කර 2023 මාර්තු 10 දින වැඩ අවසන් කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ඉකුත් වර්ෂවල ප්‍රතිපාදන ලැබී ක්‍රියාත්මක කර නොතිබූ කර්මාන්ත 07 කට අදාලව රු.280,000 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | මෙම කර්මාන්ත මේ වන විට අවසන් කරමින් පවතින බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.236,650කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ඇස්තමේන්තුවක් බිල් කළ ආදායමට එකතු කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | පසුගිය වර්ෂවල වැඩ ආරම්භ කර අතර මග ඉදි කිරීම් නතර කර තිබූ සභාව සතු ගොඩනැගිලි සංවර්ධනය කිරීමට දරන ලද රු. 3,920,532 ක වියදම ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන ලද බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------- | ---------- |
| තක්සේරු වට්නාකම, පැවරීම් වට්නාකම යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 12,000,000 ක් වූ ගිණුම් විෂයන් 02 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | තක්සේරු වාර්ථා ලැබෙන තෙක් විකුණුම් වට්නාකම මත ගිණුම්ගත කරන ලද බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------ | ------------------- | ----------------------- | ------------- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 185 | සභාව විසින් පොදු අරමුදල් ආශ්‍රිත ගනුදෙනු සඳහා පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමෙහි රු.3,235,196 ක සාමාන්‍ය මුදල් ශේෂයක් පැවති අතර එම අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 31,630,036 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,036,507 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,991,500 | 2,335,586 | 1,910,523 | 512,283 | 2,047,000 | 2,066,531 | 2,094,244 | 87,220 |
| (ii) | කුලී | 10,883,760 | 7,256,696 | 7,886,314 | 675,470 | 9,808,960 | 7,016,792 | 6,302,167 | 1,305,088 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 821,150 | 1,042,543 | 981,105 | 195,438 | 901,100 | 134,750 | 134,750 | 134,000 |
| (iv) | වෙනත් ආදායම් | 4,421,200 | 6,682,253 | 6,141,871 | 742,815 | 5,093,900 | 2,652,215 | 2,808,661 | 202,433 |
| | | 18,117,610 | 17,317,078 | 16,919,813 | 2,126,006 | 17,850,960 | 11,870,288 | 11,339,822 | 1,728,741 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව කටයුතු කර 2022 ජුනි 10 දිනැති අංක 2284 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ දියුණු කළ ප්‍රදේශවල පිහිටි දේපළවලින් වරිපනම් බදු අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | දේපල හඳුනා ගැනීමේ සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට බදු දී තිබූ සභාව සතු කඩ කාමර 36 කින් රු.440,410 ක කඩ කුලී අයවීමට තිබුණි. | හිඟ මුදල් ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 වන ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 18 කට අදාළව කඩ බදු | ක්‍රියා මාර්ග ගන්නා බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර, 06 වන ඡේදය ප්‍රකාරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ තුනක ඇති කඩ කාමර 48 ක බදු මුදල් තක්සේරු කර නොතිබුණි. | | |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු.154,773ක් හා මුද්දර ගාස්තු රු.26,567,570 ක් අය විය යුතුව තිබුණි. | මෙම වර්ෂය තුල කිසිඳු හිඟ මුද්දර ගාස්තු ආදායමක් හෝ උසාවි දඩ ආදායමක් ලැබී නොමැති බව. | ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පස්ගොඩ ප්‍රාදේශිය සභා බලප්‍රදේශය තුල සතියකට කසල ටොන් 02 ක් පමණ එක්රැස් වන අතර දිරන කසල භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනය කළද කොම්පෝස්ට් අංගනයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා කොම්පෝස්ට් අංගනයට වහලක් නොමැති වීම හේතුවෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කාර්යක්ෂමව සිදු නොවන අතර, සභා බල ප්‍රදේශයේ එක්රැස් වන දිරාපත් නොවන කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමට ස්ථිර හා විධිමත් වැඩපිළිවෙලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | වහලයක් සකස් කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බව. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කර නාගරික නොවන බල ප්‍රදේශය තුල ගොඩනැඟිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සැලසුම් හා සංවර්ධන රෙගුලාසි හා සභාව සතු මහජන ක්‍රීඩාංගනය කුලියට දීම සම්බන්ධ රෙගුලාසි ඇතුළත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා කඩිනමින් පනවා ගත යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව නාගරික බලප්‍රදේශයේ සිදු කර තිබූ ඉදිකිරීම් 07ක් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව රු.2,056,115 ක ගාස්තු අයකර විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලැසුම් අනුමත කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාදේශීය යටිතල පහසුකම් වැඩසටහන යටතේ පස්ගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ පළමු මහලේ නගර ශාලාව ඉදි කිරීම සඳහා රු.38,097,898 ක මුදලකට පසුගිය වර්ෂයේ ජූලි 09 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගත වී රු.12,651,795 ක වැඩ කොටස් ඉටු කර කොන්ත්රාත්තුවේ ඉදිකිරීම් අතරමඟ නතර කර තිබුණි. වහලයට යොදා තිබූ යකඩ කාප්ප මළ බැඳීමට ලක් වෙමින් හා ගොඩනැඟිල්ලේ බිම් මහලයටද හානි වෙමින් පැවතුණු බව නිරීක්ෂණය විය. | කර්මාන්තයේ වැඩ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් අවසන් කර ගොඩනැඟිල්ලේ ආරක්ෂාව සඳහා කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ මාවරල පොළ ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා රු.4,961,440 ක ගිවිසුම්ගත මුදලකට පසුගිය වර්ෂයේ අගෝස්තු 22 දින එක්තරා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගත වී රු.3,628,277 ක වැඩ කොටස් ඉටු කර කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් අතරමඟ නතර කර තිබූ අතර ඉතිරි වැඩ කොටස් ඉටු නොකිරීම නිසා ඉදිකර තිබූ කොටස්වලට හානිවෙමින් පවතින බව නිරීක්ෂණය විය. | කර්මාන්තයේ වැඩ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව. | කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |